අධ්‍යාපන අමාත්‍යාංශය තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

අ.පො.ස (සා.පෙළ) විභාගයට අදාළ පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 2020

නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය I	90	S	I,II	පැය තුනයි

උපදෙස් :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නයට (i) (ii) (iii) (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිළිතුරු තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

01. මිලි මීටර් වලින් ක්‍රමාංකනය කර ඇති වානේ කෝදුවක් භාවිතයෙන් දිග මැනීමේ දී පාඨාංකය කියවිය යුතු ආසන්නම අගය වන්නේ,

1) 1mm කි 2) 0.5mm කි 3) 0.25mm කි 4) 0.1mm කි

02. කිසියම් දිගක් කෙටිකර දැක්වීමට යොදාගන්නා රේඛා ඛණ්ඩය තෝරන්න.



03. 1:20 කුඩාකර ඇඳීමේ පරිමාණයට ඇඳි චිත්‍රයක එක් සරල රේඛාවක දිග 25 mm නම්, එම රේඛාවේ සැබෑ දිග කොපමණ ද?

1) 50mm කි 2) 500mm කි 3) 1000mm කි 4) 5000mm කි

04. පහත දැක්වෙන සමාංශක රූපය දෙස A ඊතලය දිශාවෙන් සහ B ඊතලය දිශාවෙන් බැලූ විට පෙනෙන ආකාර නිවැරදිව නිරූපණය වනුයේ, (රූප පරිමාණයට ඇඳ නැත.)



05. දී ඇති සමාංශක රූපය, A දිශාවෙන් බැලූ විට නිවැරදිව පෙන්වන රූපය තෝරන්න.



06.වර්ණ පටි හතරක ස්ථිර ප්‍රතිරෝධකයක අගය කියවීම පිළිබඳව ප්‍රකාශ පහත දැක්වේ.

A - පළමු වන හා දෙවන වර්ණ පටි වලින් සංඛ්‍යාත්මක අගය දැක්වේ .

B - හතරවන වර්ණ පටියෙන් ගුණන සාධකය දැක්වේ.

C -තෙවන වර්ණ පටියෙන් ගුණන සාධකය දැක්වේ.

ඉහත ප්‍රකාශ වලින් නිවැරදි වන්නේ ,

1)A පමණි　　　　2) B පමණි

3) A හා B පමණි　　　　4) A හා C පමණි

07.පහත දැක්වෙන්නේ මල්ටි මීටරයක මුහුණතකි. එහි පරාස කෝණය 0.6 A පරාස කෝණයට යොමු කර ඇති විට දර්ශකයෙහි පෙන්නුම් කරන ධාරාවෙහි අගය කොපමණද ?



1) 8 A 2) 80 mA 3) 180 mA 4) 8mA

08. ප්‍රතිසම මල්ටිමීටරයක හා සංඛ්‍යාංක මල්ටිමීටරයක අභ්‍යන්තර ප්‍රතිරෝධකය පිලිවෙලින්

1) අඩුය , වැඩිය 2) වැඩිය , අඩුය

3) වැඩිය , වැඩිය 4) අඩුය , අඩුය

09. පාසල් ශිෂ්‍යයකු තම නිවසේ විදුලි පහන් නිරීක්ෂනය කිරීමේදී ඉන් කිහිපයක් සමග කෙවෙනියක් ක්‍රියා නොකරන බව නිරීක්ෂණය විය. ප්‍රධාන ස්විචය අක්‍රීය (Off) කල පසුව ඔහු විසින් සිදු කල යුතු කාර්යය කුමක්ද ?

1) සියළුම කෙවෙනි හා පහන් ගලවා පරීක්ෂා කිරීම.

2) අක්‍රීයව ඇති පහන් හා කෙවෙනි ගලවා පරීක්ෂා කිරීම

3) විලායක හෝ සිඟිති පරිපථ බිඳින (MCB) පරීක්ෂා කිරීම

4) ප්‍රධාන ස්විචය පරීක්ෂා කිරීම

10. ධාරිත්‍රකයක 103 J ලෙස සටහන් කර තිබිණ.මෙහි ධාරිතාව වනුයේ ;

1) 103 F 2) 10×10^3 F 3) 10×10^3 μF 4) 0.01μF

11. පහත දැක්වෙන පරිනාමකයේ ප්‍රාථමික දඟරයේ පොට පන්දු 2000 ක් පවතී නම් ද්විතික දඟරයේ පොට පන්දු කොපමණද ?



1) 2000   2) 1000   3) 50   4) 500

12. සෘජුකාරක ඩයෝඩයක උච්ච ප්‍රතිලෝම වෝල්ටීයතාව (PIV) නමින් හඳුන්වන්නේ ,

1) පෙර නැඹුරු කල විට දැරිය හැකි උපරිම වෝල්ටීයතාවයයි.

2) පෙර නැඹුරු   කල විට දැරිය හැකි උපරිම වෝල්ටීය තාවයෙන් හරි අඩකි.

3) පසු නැඹුරු කල විට දැරිය හැකි උපරිම වෝල්ටීයතාවයයි.

4) පසු නැඹුරු කල විට දැරිය හැකි උපරිම වෝල්ටීයතාවයේ හරි අඩකි

13. සෙනර් ඩයෝඩයකින් නියමිත කාර්යය සිදු කර ගැනීමටනම්,

1) පරිපථයට සම්බන්ධ කිරීමේදී පසු නැඹුරුව සම්බන්ධ කල යුතුය.

2) පරිපථයට සම්බන්ධ කිරීමේදී පෙර නැඹුරුව සම්බන්ධ කල යුතුය.

3) පරිපථයෙහි විබැරය හා ශ්‍රේණිගතව සම්බන්ධ කල යුතුය.

4) පරිපථයට සම්බන්ධ කිරීමේදී පෙර නැඹුරු හෝ පසු නැඹුරු යන ආකාර දෙකටම සම්බන්ධ කල හැක.

14. සිලිකන් වර්ගයේ ඩයෝඩයක් යොදා ඇති පරිපථයක් පහත දැක්වේ. මෙහි P හා Q අතර පිහිටන වෝල්ටීයතාවය කොපමණද?



1) 3 V   2) 120 V   3) 6 V   4) 5.4 V

15.සෙනර් ඩයෝඩයක් යොදා සකසන වෝල්ටීයතා ස්ථායීකරණ පරිපථයක විබැරයට ශ්‍රේණිගතව R_S ලෙස ප්‍රතිරෝධකයක් යෙදීමට හේතුව වන්නේ ,

1. පරිපථයකට ප්‍රතිරෝධකයක් අවශ්‍ය වීම නිසා
2. විබැරය වෙත ගලා යන ධාරාව අඩු කිරීම සඳහා
3. විබැරයට ප්‍රතිරෝධකයක් ශ්‍රේණිගතව යෙදීම කල යුතුය
4. සෙනර් ඩයෝඩය තුළින් අධික ධාරාවක් ගැලීම වැළැක්වීම සඳහා

16. ට්‍රාන්සිස්ටරයක සංක්‍රමණික ලාක්ෂණික වක්‍රය අඳිනු ලබන්නේ ,

1) I_E හි වෙනස් වීම් වලට අනුව Ic හි වෙනස් වීම් මැනීමට
2) I_E ස්ථාවරව තබන Ic හි අගය මැනීමට
3) Ic වෙනස් වීමට අනුව I_E හි වෙනස් වීම මැනීමට
4) Ic ස්ථාවරව තබා I_E හි අගය මැනීමට

17. පහත රූපයේ දැක්වෙන කාරකාත්මක වර්ධකයට පහත දැක්වෙන පරිදි තරංගයක් ප්‍රදානය කල විට ලැබෙන ප්‍රතිදාන තරංගය විය හැක්කේ,





1) 

2) 

3) 

4) 

18. ට්‍රාන්සිස්ටරයක් සම්බන්ධ ප්‍රකාශ කීපයක් පහත දැක්වේ. ඉන් සත්‍ය ප්‍රකාශය වන්නේ ,

1) ට්‍රාන්සිස්ටරයක් ක්‍රියාකාරී වීමට නම් පාදම විමෝචක සන්ධිය පසු නැඹුරු විය යුතුය.

2) ට්‍රාන්සිස්ටරයක් ක්‍රියාකාරී වීමට නම් පාදම විමෝචක සන්ධිය පෙර නැඹුරු විය යුතුය.

3) ට්‍රාන්සිස්ටරයක ධාරා ලාභය යනු සංග්‍රාහක ධාරාවට පාදම ධාරාව දක්වන අනුපාතයයි.

4) ට්‍රාන්සිස්ටරයක පාදම ධාරාව මිලි ඇම්පියර් අගයක් ගනී.

19. පහත සත්‍යතා වගුව කුමන ද්වාරයක් සඳහා ගැලපේද?

A	B	Q
0	0	0
0	1	1
1	0	1
1	1	1

1) NAND 2) AND 3)NOR 4) OR

20. චුම්බක ක්ෂේත්‍රයක් තුළ පවතින සන්නායකයක් භ්‍රමණයට අවශ්‍ය ව්‍යාවර්ථය රඳා පවතින සාධක ලෙස පාසල් සිසුවකු පහත සාධක ඉදිරිපත් කරන ලදි.

A . දඟරයේ වර්ග ඵලය

B. සන්නායකයක් තුළින් ගලන ධාරාව

C. චුම්භක ක්ෂේත්‍රයේ ප්‍රබලතාව

නිවැරදි සාධක ඇතුළත් පිළිතුර වන්නේ

1) A හා B. 2) B හා C 3) A හා C 4) A , B හා C

21. සරල ධාරා මෝටරයක් හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. ඉන් සත්‍ය ප්‍රකාශය විය හැක්කේ,

1) ක්ෂේත්‍ර දඟරය සහ ආමේචර දඟරය ශ්‍රේණිගතව හා සමාන්තර ගතව යන ක්‍රම දෙකටම අනුව සම්බන්ධ කල හැක.

2) DPST ස්විචයකින් භ්‍රමන දිශාව මාරු කල හැක.

3) තෙකලා විදුලි මෝටර ලෙස පවතී

4)ක්ෂේත්‍ර දඟරයේ පමණක් සරල ධාරාව සැපයීම ප්‍රමාණවත් වේ.

22 . සංඛ්‍යාත මූර්ජිත ගුවන් විදුලි තරංග විකාශනය සඳහා ශ්‍රී ලංකාව තුළ භාවිතා වන විද්‍යුත් චුම්භක සංඛ්‍යාත පරාසය කුමක්ද ?

1) 1 .5 MHz - 30MHz
2) 175 MHz - 220 MHz
3) 88 MHz - 108 MHz
4) 11.7 GHz - 12.1 GHz

23. 12 V මෝටර් රථ බැටරියක වෝල්ටීයතාව මැනීම සඳහා මල්ටිමීටරයේ පරාස තෝරනුයේ යෙදිය යුතු සුදුසුම අගය පරාසය වනුයේ,

1) 10 V
2) 20 V
3) 50 V
4) 100 V

24. නිවසට ලැබෙන ප්‍රධාන විදුලි සැපයුමේ වෝල්ටීයතාව 230 V නම් එම වෝල්ටීයතා තරංගයේ ශීර්ෂ වෝල්ටීයතාව (V_P) කොපමණද ?

1) 110 V
2) 230 V
3) 325 V
4) 415 V

25. පරිනාමකයක විවිධාකාරයෙන් ශක්ති හානි සිදු වේ. එම හානි අවම කිරීමට විවිධ උපක්‍රම භාවිත කරයි. ඒ අතුරින් එහි හරය සඳහා තනි යකඩ කොටසක් වෙනුවට පරිවරනය කරන ලද තහඩු කිහිපයක් භාවිත කරයි. එමඟින් බලාපොරොත්තු වන්නේ කුමන හානිය අවම කර ගැනීමද ?

1) සුළි ධාරා හානිය
2) මන්දායන හානිය
3) තඹ හානිය
4) තාප හානිය

26.ක්‍රියාකාරී වෝල්ටීයතාවය 2 V හා 10 mA වන LED බල්බයක් 9 V බැටරියකට සම්බන්ධ කිරීම සඳහා යොදා ගත යුතු ප්‍රතිරෝධයේ අගය වනුයේ,

1) 500 Ω
2) 700 Ω
3) 800 Ω
4) 900 Ω

27. සෙනර් ඩයෝඩයක් සම්බන්ධව වැරදි ප්‍රකාශය වනුයේ,

1) පෙර නැඹුරු අවස්ථාවේ දී සාමාන්‍ය ඩයෝඩයක් ලෙස ක්‍රියා කරයි.

2)පසු නැඹුරු අවස්ථාවේදී ධාරාවක් ගමන් නොකරයි.

3)සෙනර් වෝල්ටීයතාව ඉක්මවා යාමේදී පසු නැඹුරු ධාරාවක් ගමන් කරයි.

4)වෝල්ටියතා ස්ථායිකරණයට භාවිත කරයි.

28. වෝල්ටීයතා ස්ථායිකරණය කිරීම සඳහා ස්ථායිකරණ සංගෘහිත පරිපථ (IC) භාවිත කරයි. 7806 යන IC එක භාවිතයෙන් ලබා ගත හැකි ප්‍රතිදාන වෝල්ටීයතා අගය වනුයේ

1) 6 V

2) 8 V

3) 7 V

4)78 V

29. ට්‍රාන්සිස්ටරය ස්විචයක් ලෙස භාවිත කිරීමෙන් ලබා ගත හැකි වාසියක් නොවන්නේ

1) විද්‍යුත් පුළිඟු ඇති නොවීම

2) ශබ්දය පිට නොවීම

3) පහසුවෙන් ප්‍රත්‍යාවර්ථ ධාරා පාලනය කළ හැකි වීම

4)අධික වේගයෙන් ක්‍රියාත්මක කළ හැකි වීම

30. පහත දැක්වෙනුයේ ට්‍රාන්සිස්ටරයක සංක්‍රමණ ලක්ෂණික වක්‍රයයි.



එහි A , B හා C කලාප පිළිවෙලින් වනුයේ

1) කපා හැරී , ක්‍රියාකාරී හා සංතෘප්ත

2)ක්‍රියාකාරී , කපා හැරී හා සංතෘප්ත

3)සංතෘප්ත , කපා හැරී හා ක්‍රියාකාරී

4) ක්‍රියාකාරී , සංකේත හා කපා හැරී

31. 1kΩ ± 5% ලෙස සඳහන් කර ඇති ප්‍රතිරෝධයක වර්ණ තීරු පිළිවෙලින් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ ,

1) දුඹුරු,රතු ,කළු ,රන්

2) දුඹුරු,කළු ,කහ ,රිදී

3)දුඹුරු,කළු ,රතු ,රන්

4) දුඹුරු ,කළු ,තැ ඹිලි ,රිදී

32. ප්‍රකාශ ඩයෝඩයක් දැක්වීම සඳහා භාවිතා කරන සංකේතය කුමක්ද?

1)

2)

3)

3)

33. මෙම තරංග හැඩයෙන් නිරූපණය වන ද්විමය සංඛ්‍යාව වන්නේ ,



1) 10011100_2 2) 10011010_2 3) 11011010_2 4) 10010010_2

34. කාරක වර්ධකයක විශේෂ ලක්ෂණයක් නොවන්නේ ,

1)වැඩි ධාරාවක් ප්‍රතිදානයෙන් ලබා ගත හැකිවීමයි

2)වෝල්ටීයතා සංසන්දනය කරගත හැකිවීමයි

3) විශාල සංඛ්‍යාත පරාසයක් වර්ධනය කරගත හැකි වීමයි

4) ඉතා විශාල ධාරාවක් ලබා ගැනීමයි

35. 2A416 අගයට තුල්‍ය වන දශමය සංඛ්‍යාව කුමක්ද?

1) 678 2) 676 3) 576 4)726

36.ඉලෙක්ට්‍රොනික් පරිපථ පෑස්සීම සඳහා ටින් හා ඊයම් මිශ්‍ර ලෝ හයක් භාවිත කරයි.එහි සුදුසුම ටින් හා ඊයම් මිශ්‍රණ අනුපාතය වනුයේ

1) 60% හා 40% 2) 50% හා 50%

2) 25% හා 75% 4) 80% හා 20%

37. 110V ප්‍රත්‍යාවර්ථ විදුලි බලයකින් ක්‍රියාත්මක වන උපකරණයක් ප්‍රධාන විදුලි සැපයුමට සම්බන්ධ කිරීමට භාවිත කරන පරිනාමකයේ ද්විතීක දහරයේ පොට සංඛ්‍යාව 20ක් නම් ප්‍රාථමික දහරයේ පොට සංඛ්‍යාව කොපමණ වේද ?

1) 10 2) 22 3) 30 4) 42

38. Aහා B අතර සමක ධාරිතාව සොයන්න.



1) 1μF 2) 2 μF 3) 4μF 4) 8μF

39.



ඉහත පරිපථයෙන් ලැබෙන පුතිදාන තරංගයේ තරංග ආකාර වනුයේ

1)


3)


2)


4)


40. පහත දැක්වෙන පරිපථයේ B ප්‍රතිරෝධය හරහා විභව බැස්ම කීයද ?



1) 1 2) 2 3)3 4) 4

අධ්‍යාපන අමාත්‍යාංශය තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

අ.පො.ස (සා.පෙළ) විභාගයට අදාළ පෙරහුරු ප්‍රශ්න පත්‍රය - **2020**

නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය II	90	S	I,II

උපදෙස් :

- පළමු වැනි ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01.

ලී අල්ලුවක සමාංශක පෙනුම පහත රූපයේ දක්වා ඇත. මෙම රූපයේ A දෙසින් බලා ඉදිරි පෙනුමද, B දෙසින් බලා පැති පෙනුමද, C දෙසින් බලා සැලැස්මද තෙවන කෝණ ප්‍රක්ෂේපන මූලධර්මයට අනුව 1:1 පරිමාණයට අනුව ඇඳින්න.



සම්මත රාමුව අවශ්‍ය නොවේ. නිවැරදිව මාන යෙදිය යුතුය.

නිවැරදිව පෙනුම් ස්ථානගත කිරීම	ලකුණු 12 (ලකුණු 4 බැගින්×3)
නිවැරදිව පෙනුම් නම් කිරීම	ලකුණු 3 (ලකුණු 1 බැගින්×3)
සැඟි රේඛා සඳහා	ලකුණු 2 (ලකුණු 1 බැගින්×2)
නිවැරදි මාන යෙදීම් සඳහා	ලකුණු 3 (ලකුණු 1 බැගින්×3)

02.

I. ගෘහ විද්‍යුත් පරිපථයක භාවිත වන ප්‍රධාන කොටස් නම් කර එම වර්ග වලට අදාළ උපාංග 2 බැගින් දක්වන්න .

(ලකුණු 03)

ii. පාරිභෝගික ඒකකය තුල සම්බන්ධ වන ප්‍රධාන උපාංග 3 නම් කර ඒවා සම්බන්ධ වන අනුපිළිවෙල දක්වන්න

(ලකුණු 03)

iii. පහත දැක්වෙන ලක්ෂණ සම්බන්ධයෙන් ප්‍රතිසම මල්ටිමීටරය හා සංඛ්‍යාංක මල්ටිමීටරය අතර ඇති වෙනස්කම් කෙටියෙන් පහදන්න.

අභ්‍යන්තර ප්‍රතිරෝධය

දර්ශකය භාවිතයෙන් පාඨාන්ක ලබා ගැනීම

උපරිම සීමාව

ස්විචයක අවශ්‍යතාව

(ලකුණු 04)

03.

i. ප්‍රේරතාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක 4ක් දක්වන්න. (ලකුණු 02)

ii. ප්‍රතිවිද්‍යුත් ගාමක බලය හට ගන්නා උපාංග 3ක් නම් කරන්න (ලකුණු 02)

.

iii. පහත දැක්වෙන විද්‍යුත් චුම්භකයේ ධාරාව ගමන් කරන දිශාව හා චුම්භක බල රේඛා වල දිශාවත් ධ්‍රැව දෙකත් සලකුණු කරන්න. (ලකුණු 05)



iv. මේ සඳහා බලපාන නියමය නම් කරන්න (ලකුණු 01)

04. පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා අදාළ පරිපථය භාවිත කරන්න.



i) මෙය කුමන අකාරයේ වර්ධක පරිපථයක්ද? (ලකුණු 01)

ii) මෙහිදී ඔබ සිදු කරන උපකල්පනයක් සඳහන් කරන්න. (ලකුණු 02)

iii) ප්‍රතිපෝෂණ ධාරාව (i_f) ගණනය කරන්න. (ලකුණු 04)

iv) ප්‍රතිදාන වෝල්ටීයතාව (V_O) ගණනය කරන්න. (ලකුණු 03)

05.



$R_C = 3.3k\Omega$

$V_{CE} = 0.3V$

$V_{BE} = 0.7$ V

i) ඉහත පරිපථයේ කුමන නැඹුරුම් ක්‍රමයක් භාවිත වේද ? (ලකුණු 01)

ii) සංග්‍රාහක ධාරාව (I_C) සොයන්න (ලකුණු 03)

iii) පාදම ධාරාව (I_B) සොයන්න (ලකුණු 03)

iv) R_B ප්‍රතිරෝධයේ අගය සොයන්න (ලකුණු 04)

06.

එක්තරා වේල්ලක පිටාර ජල මට්ටම හා පහළ ජාල මට්ටම හඳුනා ගැනීම සඳහා A හා B යනුවෙන් සංවේදක දෙකක් සවි කිරීමට අවශ්‍යාව ඇත.අදාළ ජල මට්ටම පිටාර ජල මට්ටමට වඩා ඉහලින් පිහිටි විට (A =1) හෝ පහල ජල මට්ටමට වඩා පහලින් පිහිටි විට (B=0) විශාල ශබ්දයක් නගමින් සංඥාවක් නිකුත් කෙරේ.අනෙකුත් සියලු අවස්ථා සඳහා C = 0 වේ .

i) ඔබ දන්නා ද්වාර වර්ග 4ක් නම් කරන්න (ලකුණු 02)

ii) සංඥාවට අදාලව සත්‍යතා වගුව ගොඩ නගන්න (ලකුණු 04)

A	B	C

iii) ඉහත සත්‍යතා වගුව සඳහා බූලීය ප්‍රකාශනය ව්‍යුත්පන්න කරන්න (ලකුණු 04)

7. 12V /6W බල්බ 15 ක් ශ්‍රේණිගතව සම්බන්ධ කිරීමෙන් විසිතුරු බල්බ වැලක් සෑදීමට අවශ්‍ය විය .

i) මෙම බල්බ වැල ක්‍රියාත්මක වීමට අවශ්‍ය වෝල්ටීයතාවය ගණනය කරන්න (ලකුණු 01)

ii) ලබා ගන්නා උපරිම ධාරාව සොයන්න (ලකුණු 02)

iii) මෙම පද්ධතිය 230 V_{AC} විදුලි සැපයුමට සම්බන්ධ කිරීමට ශ්‍රේණිගතව යෙදිය යුතු ප්‍රතිරෝධකයේ අගය සොයන්න (ලකුණු 03)

iv) ප්‍රතිරෝධකය මගින් ඇති කරනු ලබන ජව හානිය ගණනය කරන්න (ලකුණු 04)

LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440